55

වගා අධිකාර චක්‍රලේඛ අංක : 30

මගේ අංකය :- සං/ව.ඇ/ප්‍රති 1V
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ 03.
1990.10.10 දින

සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත.

තේ වගා සහනාධාර අවසරපත්‍ර පිළිබඳ 1990 අගෝස්තු
ප්‍රවෘත්ති දැන්වීම

සමාන්ත ඝා 1990.09.02 දිනැ ති ලිපිය සමග එවන ලද යටෝක්ත ප්‍රවෘත්ති දැන්වීම් දෙතේ ඇතුළත් තරුණුවලට අතිරේකවයි.

02. එම ප්‍රවෘත්ති දැන්වීම්වල පරමාර්ථය නම් තල්පයුවූ අවසර පත්‍ර යටතේ වාරිත ගෙවීම්වලට අදාළ වැඩකොටස් නොනිරීම, අතරමග නැවැත්වීම සහ ප්‍රමාද කිරීම් වළක්වා නියමිත කාලය තුළදීම සාර්ථකව අදාළ වැඩ කොටස් නිම කිරීමට අවසරපත්‍ර හිමිකරුවන් පෙළඹවීමයි.

03. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී මතුවී ඇති ගැටළු සහගත තත්ත්වයන් වළක්වාලීම අවශ්‍ය බැවින් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන්න.

1. <u>පාඩු සැපයීමේ ආධාර කුමය යටතේ ගෙවීම්:</u>

(අ) ප්‍රවෘත්ති දැන්වීමේ සඳහන් 1990.08.01 දිනය වනවිට වලංගු කාලය ඉක්මගොස් ඇති අවසරපත්‍ර යටතේ වුවද එම දිනට පෙර තීන්දුකළ සාර්ථක ලෙස පාඩු සැපයීම අවසන් කර ඇති බව වාර්තා වේ නම් පළමු වාරික ගෙවීම කළ හැකිය.

(ආ) තවද <u>1989 වර්ෂයේදී පාඩු ආධාර කුමය යටතේ</u> නිකුත් කරන ලද අවසර පත්‍ර අතුරින් පාඩු සපයා ඇති බවට මෙතෙක් වාර්තා කර නොමැති අවසර පත්‍ර වෙනුවෙන්ද පයුගිය වර්ෂවල පැල සපයා ගැනීමේදී සිදුවූ දුෂ්කරතාවය සලකා තවත් එක් වගා තීන්දුවක් තල්දීමට තීරණය කර ඇත.

ඒ අනුව ඔක්තෝබර්/නොවැම්බර් වගා තීන්දු අදාළ ප්‍රදේශවල 1990 දෙසැම්බර් 31 දිනට පෙරද මැයි/ජූනි වගා තීන්දු අදාළ ප්‍රදේශවල 1991 අගෝස්තු 31 දිනට පෙරද පාඩු සපයා අවසන් නොකරන අවසර පත්‍ර අවලංගු වූවාසේ සැලකිය යුතුය.

(ඇ) පාඩු දෙවැනි වාරික මුදල ලබාගැනීමට අදාළ සුදුසුකම් සම්පූර්ණකර ඇති අවසර පත්‍ර වෙනුවෙන් වාර්තා කිරීමට දැනුම්දී ඇති 1990 සැප්තැම්බර්

2. 1990 අත්තරුයතට වැඩි බිම් ප්‍රමාණයන් ඉල්ලුම් කර අත්තරයතට සීමාවන පරිදි නිකුත් කරන ලද අලුත් වගා අවසරපත්‍ර යටතේ හෝ එහි තවත් අතිරේක බිම් ප්‍රමාණයන් සඳහා අවසර පත්‍රය දීර්ඝ කෙරේ නම් හෝ 1990.05.15 දිනැති චක්‍රලේඛ අංක 242 ව/ආ/ප්‍රති දරණ ලිපියේ 2:1 සහ 2:2 ඡේද යටතේ දක්වා ඇති සීමාවන් තවදුරටත් බල නොපවත්වන බවද දැනුම් දෙමි.

(ආචාර්ය සරත් බී. මනන්වත්ත)
සභාපති.

පිටපත් :- 1. නියෝජ්‍ය කොමසාරිස් (සංවර්ධන/මුදල්/ව්‍යාප්ති).
2. අභ්‍යන්තර විගණන.
3. ස්ථාන භාර නිලධාරී (උපකාර්යාල)
4. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.

..... මහතා/මහත්මිය.

ප්‍රිය මහත්මයානි/මහත්මියනි,

පාට සැපයීමේ ආධාර ක්‍රමය
අවසරපත්‍ර අංකය :

ඔබ නමින් නිකුත් කර ඇති ඉහත අවසර පත්‍රය යටතේ පාළු සිටුවීම/පාට සිටුවා වර්ෂ ..... ත් නඩත්තු කිරීම පිළිබඳ වාරික මුදල් ලබාගැනීම සඳහා ඔබ මෙතෙක් දැනුම් දීමක් කර නොමැත.

02. මෙම අවසර පත්‍රය යටතේ වාරිකයට අදාළ වැඩ කොටස සාර්ථක ලෙස අවසන් කොට ඒ බව 19 ..... දිනට පෙර මා වෙත දැනුම් දීමට අවශ්‍යවේ. එසේ දැනුම් දීමක් නොකරන සියලුඅවසරපත්‍ර අවලංගුකිරීමට තීරණය කර ඇති බව කරුණාවෙන් සලකන්න.

මෙයට විශ්වාසී වූ,

ප්‍රාදේශීය කළමණාකරු.